# ප්‍රවෘත්ති නිවේදනය
# PRESS RELEASE

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය
சுகாதார மற்றும் சுதேச வைத்திய சேவைகள் அமைச்சு அத்துடன் பெண்கள் மற்றும் சிறுவர் மற்றும் சமுக பாதுகாப்பு
Ministry of Women & Child Affairs, Social Security, Health & Indigenous Medicine Services

Telephone office: 2693919 / Gen: 2694033 / 2669192 / 2675011 / 2675449 / Fax: 2689540


**2020.03.16**

ප්‍රධාන කර්තෘ පුවත්පත්,
ප්‍රවෘත්ති අධ්‍යක්ෂ - රූපවාහිනී /ගුවන්විදුලි
සංස්කාරක වෙබ් පුවත්,

**කොරෝනා වෛරසය ව්‍යාප්තියේ අවධානම හේතුවෙන් අත්‍යාවශ්‍ය සේවා ලබාගැනීම සඳහා පමණක් ජාතික අක්ෂි රෝහලට පැමිණෙන ලෙස ජාතික අක්ෂි රෝහලේ අධ්‍යක්ෂවරිය ජනතාවගෙන් ඉල්ලීමක් කරයි.**

කොරෝනා වෛරසය ව්‍යාප්තියේ අවධානම හේතුවෙන් හදිසි අනතුරු, සායනික ප්‍රතිකාර හා අත්‍යාවශ්‍ය සේවාවන් ලබාගැනීම සඳහා පමණක් ජාතික අක්ෂි රෝහලට පැමිණෙන ලෙස ජාතික අක්ෂි රෝහලේ අධ්‍යක්ෂවරිය වෛද්‍ය ඩබ්.එල්.එල්.යූ.සී. කුමාරතිලක මහත්මිය ජනතාවගෙන් ඉල්ලා සිටියි.

ශ්‍රී ලංකා ජාතික අක්ෂි රෝහලට එක් දිනකට ප්‍රතිකාර හා සේවාවන් ලබාගැනීම සඳහා පුද්ගලයින් 3000 ක් පමණ පැමිණෙන බවත්, මෙවන් ඉතා විශාල සේවාලාභීන් පිරිසක් එක් ස්ථානයකට ඒකරාශි වීම තුල කොරෝනා වෛරසය ව්‍යාප්තවීමේ අවධානමක් ඇති බව ජාතික අක්ෂි රෝහලේ අධ්‍යක්ෂතුමිය පෙන්වා දෙයි.

රට තුල මෙම වෛරසය ව්‍යාප්තිය වැළැක්වීම උදෙසා ජනතාව විශාල වශයෙන් රැස්වන අවස්ථා හැකි උපරිමයෙන් සීමා කිරීමට රජය තීරණය කර ඇති බැවින් හදිසි අනතුරු, සායනික ප්‍රතිකාර හා අත්‍යාවශ්‍ය සේවාවන් ලබාගැනීම සඳහා පමණක් ජාතික අක්ෂි රෝහලට පැමිණීම ඉතා සුදුසු බවත්, අක්ෂි රෝග සඳහා ප්‍රතිකාර ලබාගැනීමට තමාට ආසන්නතම රජයේ රෝහලක අක්ෂි සායනය වෙත යොමු වන ලෙසත් ජාතික අක්ෂි රෝහලේ අධ්‍යක්ෂවරිය වෛද්‍ය ඩබ්.එල්.එල්.යූ.සී. කුමාරතිලක මහත්මිය වැඩිදුරටත් ජනතාවගෙන් ඉල්ලා සිටියි.


විරාජ් අබේසිංහ
(මාධ්‍ය ලේකම්)
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය